SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# අදියර I විභාගය - 2024 ජනවාරි

## යෝජිත උත්තර

# (104) ව්‍යාපාරික පරිසරය (BEN)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන: 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2024 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

# යෝජිත උත්තර

අනිවාර්ය ප්‍රශ්න 20 කි
(මුළු ලකුණු 40)

**A කොටස**

### *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:*

**1.1** (3)

**1.2** (4)

**1.3** (1)

**1.4** (3)

**1.5** (4)

**1.6** (1)

**1.7** (1)

**1.8** (1)

***1.9*** (3)

**1.10** (2)

***(එකකට ලකුණු දෙක (02) බැගින් මුළු ලකුණු 20 කි)***

**1.11** අසත්‍යයි

**1.12** සත්‍යයි

**1.13** සත්‍යයි

**1.14** අසත්‍යයි

**1.15** සත්‍යයි

***(එකකට ලකුණු දෙක (02) බැගින් මුළු ලකුණු 10 කි)***

**1.16.**

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ ඕනෑම දෙයක් අගය කිරීමේදී මුදල් අගය භාවිත කිරීම මෙහි අදහසයි. මෙම මිනුම මිල ලෙස හඳුන්වන අතර මිල මත පදනම්ව වෙළෙඳපොලේ භාණ්ඩ හා සේවා හුවමාරු වීම සිදු වේ. මිල හේතුවෙන් ගිණුම් තැබීම පහසු වී ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීමට හැකියාව ලැබී ඇත.

***(ලකුණු 02 යි)***

**1.17.**

උපරිම විශ්වාසය යනු රක්ෂණය කරනු ලබන විෂය වස්තුව සම්බන්ධයෙන් රක්ෂකයා හා රක්ෂිතයා අතර හෙළිදරව් කරගත යුතු සියලු තොරතුරු සද්භාවයෙන් යුතුව හෙලිදරව් කළ යුතු බවයි. ඒ අනුව රක්ෂණ ගිවිසුමකදී රක්ෂකත්, රක්ෂිතත් යන දෙපාර්ශවයම අත්‍යාධික විශ්වාසයෙන් යුතුව සෑම විටම කටයුතු කළ යුතුය.

***(ලකුණු 02 යි)***

**1.18.**

(i) ඇතැම් ජන කොටස් තුළ පවතින සෘණාත්මක ආකල්ප.

(ii) පහසුකම් සපයන ආයතන තුළ කාන්තාවන්ට ඇති අඩු පිළිගැනීම.

(iii) රජයේ දිරිගැන්වීම් ප්‍රමාණවත් නොවීම.

(iv) පුරුෂාධිපත්‍ය සංකල්පය මුල් බැසගෙන තිබීම.

(v) නිවසේ කටයුතු සඳහා වැඩි කාලයක් යෙදවීමට සිදු වීම.

(vi) ව්‍යවසායකයින් ලෙස කාන්තාවන්ට ලැබෙන පිළිගැනීම අඩු වීම.

(vii) සංස්කෘතිමය වශයෙන් කාන්තාවන්ට ඇති බාධක.

(viii) කාන්තා ව්‍යවසායකත්වය සම්බන්ධ දිරිගැන්වීම් අඩු වීම.

(ix) ඇතැම් රටවල නීති රීති මගින් ඇති කරන පීඩනය.

***(ලකුණු 02 යි)***

**1.19.**

(i) ව්‍යාපාරය පිලිබඳ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය තහවුරු වීම.

(ii) තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි විම .

(iii) ව්‍යාපාරයේ මූල්‍ය කටයුතු කාර්යක්ෂම වීම.

(iv) කාර්මික සම්බන්ධතා යහපත් වීම.

(v) ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම මගින් ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම.

(vi) බුද්ධිමය දේපල ආරක්ෂා වීම.

***(ලකුණු 02 යි)***

SRI LANKA

**1.20.** (i) සුදානම් හා අඛණ්ඩ වෙළෙඳපොලක් වීම.

(ii) ආයෝජකයන්ට ආරක්ෂාව සැලසීම.

(iii) ප්‍රාග්ධන උත්පාදනය සඳහා සහාය ලබාදීම.

(iv) සුරැකුම්පත් නිවැරදිව සමාලෝචනය කිරීම.

(v) ප්‍රාග්ධනය නිවැරදිව යොමු කිරීම.

(vi) අරමුදල් සම්පාදනය සඳහා සහභාගි වීම.

(vii) සමීක්ෂණ සඳහා පහසුකම් සැපයීම.

(viii) සුරැකුම්පත්වල නියමිත කාලය.

(ix) ව්‍යාපාර තොරතුරු නිෂ්කාශනය කිරීම.

***(ලකුණු 02 යි)***

***(මුළු ලකුණු 40 යි)***

aat SRI LANKA

***A කොටසෙහි අවසානය***

**(මුළු ලකුණු 40 යි)** **B කොටස**

## *දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

*පරිච්ඡේදය 01 - ව්‍යාපාර සංකල්ප හා විවිධ වර්ගයේ ව්‍යාපාර සංවිධාන වර්ග*

**(a)**

| | |
|---|---|
| **අයිතිය** | හවුල්කරුවන් 02ත් 20ත් අතර සංඛ්‍යාවකට සීමා වීම. නමුත් වෘත්තීය ක්ෂේත්‍රවල සේවා සපයන හවුල් ව්‍යාපාර සඳහා උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව සීමාවක් නොමැත |
| **ප්‍රාග්ධනයට දායක වීම** | හවුල්කරුවන් ගිවිසගත් පරිදි ප්‍රාග්ධනයට දායක වේ |
| **අසීමිත වගකීම** | හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වේ |
| **කළමනාකරණය** | සියලු හවුල්කරුවන් හෝ හවුල්කරුවන් කිහිප දෙනෙකු විසින් සිදු කරයි |
| **ලාභ බෙදාගැනීම** | හවුල්කරුවන් ගිවිසගත් පරිදි සහ හවුල් ව්‍යාපාර ආඥාපනත අනුවලාභ බෙදා ගනු ලැබේ. |
| **අඛණ්ඩ පැවැත්ම** | අඛණ්ඩ පැවැත්මක් නැත |
| **නීතිමය පුද්ගලභාවය** | නීතිමය පුද්ගලභාවයක් හිමි නොවේ. හවුල්කරුවන්ගේ පුද්ගලික නම්වලින් නීතිය ඉදිරියේ පෙනී සිටිය යුතුවේ |
| **ලියාපදිංචිය** | සියලු හවුල්කරුවන්ගේ නම්වලින් පවත්වාගෙන යන්නේ නම් ව්‍යාපාර නාම ලියාපදිංචිය අනිවාර්ය නොවේ |
| **ගිණුම් තැබීම හා විගණනය** | අනිවාර්ය නොවේ |
| **විසුරුවා හැරීම** | අධිකරණය මගින් හෝ ස්වෙච්ඡාවෙන් විසුරුවා හැරීම සිදුවේ |
| **බඳු ගෙවීම** | ව්‍යාපාරය නමින් බදු ගෙවිය නොහැකි අතර හවුල්කරුවන් තනි තනිව බදු ගෙවීම කළ යුතු වේ |

***(ලකුණු 04 යි)***

**(b)** (i) හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම.

(ii) නීතිමය පෞරුෂයක් නොමැතිකම.

(iii) ප්‍රාග්ධන සම්පාදන මාර්ගවලට ප්‍රවේශය සීමා සහිත වීම නිසා ව්‍යාපාරය පුළුල් කිරීම අපහසුවීම.

(iv) ව්‍යාපාරය සාර්ථකත්වය හවුල්කරුවන්ගේ ව්‍යවසායකත්ව හැකියාව මත රඳා පැවතීම.

(v) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

(vi) හවුල්කරුවන් තනිවම පාඩුව විඳ දරාගත යුතු වීම.

(vii) දක්ෂ සේවකයන් ආකර්ෂණය කර ගැනීම දුෂ්කර වීම.

SRI LANKA

(viii) ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසුවීම.

(ix) අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය සහ හවුල්කරුවන් අනෙක් හවුල්කරුවන්ගේ ක්‍රියාවන් කෙරෙහි වගකීමට බැඳීම.

(x) හවුල්කරුවන් අතර ගැටුම් සහ මතභේද ඇතිවීමට ඇති ඉඩකඩ.

***(ලකුණු 03 යි)***

**(c)** (i) හවුල් ව්‍යාපාරයේ කටයුතු සඳහා දායකවීම.

(ii) රහස් ලාභ නොලැබීම.

(iii) හවුල් ව්‍යාපාරයේ යහපැවැත්ම සඳහා කටයුතු කිරීම.

(iv) තරගකාරී වෙනත් ව්‍යාපාරවල නොයෙදීම.

(v) සද්භාවයෙන් යුතුව කටයුතු කිරීම.

(vi) අලාභ සඳහා දායක වීම.

(vii) සෑම හවුල්කරුවකුම පුද්ගලිකව හා සාමූහිකව ව්‍යාපාරයේ වගකීමට යටත් වීම.

(viii) තම බලතල ඉක්මවා කටයුතු නොකිරීම.

(xi) ව්‍යාපාරයේ දේපල තම පෞද්ගලික දේපළ සේ සලකා පරිහරණය නොකිරීම.

***(ලකුණු 03 යි)***
***(මුළු ලකුණු 10 යි)***

## ***තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ***

| |
|---|
| ***පරිච්ඡේදය 03 - ව්‍යාපාර වලට අදාල උපකාරක සේවා - ප්‍රවාහනය***<br>***පරිච්ඡේදය 04 - ව්‍යාපාර සංවිධානවල වෙළඳාම*** |

SRI LANKA

**(a)**

**ව්‍යාපාර ක්‍රියාවලිය සක්‍රීය කිරීම -** නිසි ලෙස සැලසුම් කර ඇති ප්‍රවාහනයේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික වශයෙන් ඉතිරියක් අත්පත්කර ගැනීම, සංවිධානාත්මක බෙදාහැරීම්වල ප්‍රතිලාභ වැඩි දියුණු කරගත හැකිය.

**සැපයුම් දාමයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු වීම -** ශීඝ්‍රයෙන් අපනයන බෙදාහැරීම් සඳහා පමණක් නොව, අමුද්‍රව්‍ය ලබා ගැනීම සහ ගබඩා කිරීම සඳහා ප්‍රවාහනය අවශ්‍ය වේ. විශ්වාසනීය ප්‍රවාහන පද්ධතියක් මඟින් ඒවා හැසිරවීමේ කාර්යක්ෂමතාව වැඩි කළ හැකිය.

**පාරිභෝගික තෘප්තිය වැඩි කිරීම -** නිෂ්පාදන නියමිත වේලාවට වෙළෙඳපොලට හොඳ තත්ත්වයෙන් පැමිණීම සහතික කිරීමට ප්‍රවාහනය උපකාරී වේ. මෙය නිෂ්පාදන පිළිබඳ පාරිභෝගිකයින්ගේ තෘප්තිය වැඩි දියුණු කරයි.

**නියමිත වේලාවට අමුද්‍රව්‍ය ලබාගැනීමට හැකි වීම -** හොඳ ප්‍රවාහන පද්ධතියක් තිබේ නම්, එය නිෂ්පාදනය සඳහා නියමිත වේලාවට ද්‍රව්‍ය ලබා ගැනීමට උපකාරී වේ. එහි ප්‍රතිඵලය වන්නේ ව්‍යාපාරයේ තොග හිඟ වීම වළක්වා ගැනීමට හැකි වීම සහ නියමිත වේලාවට නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීමට හැකි වීමයි.

***(ලකුණු 03 යි)***

(b)

- පාරිභෝගික සේවාව වැඩිදියුණු කළ හැකි වීම
- වඩා හොඳ තොග කළමනාකරණයක් කළ හැකි වීම
- තරගකාරී වාසි ලබාගත හැකි වීම
- දවසේ ඕනෑම වේලාවක ව්‍යාපාර කටයුතු සිදු කිරීමේ හැකියාව
- ආරම්භක පිරිවැය අවම වීම
- අතරමැදියන් අවම වීමෙන් මිල මට්ටම් අඩු වීම
- නිෂ්පාදන තෝරාගැනීමේ අවස්ථාව පුළුල් වීම
- ලේඛන භාවිතය අවම වීම
- ව්‍යාපාර කටයුතු වේගවත් වීම
- ගනුදෙනුකරුවන්ගේ කාලය සහ ශ්‍රමය ඉතිරි වීම
- වෙළෙඳපොළ පුළුල් වීම
- නව නිශ්පාදිත භාවිතා කිරීමට අවස්ථාව සැලසීම
- මෙහෙයුමේ කාර්යක්ෂමතාව වැඩි වීම

***(ලකුණු 03 යි)***

(c)

නෞභාරපත
නාමමාත්‍ර ඉන්වොයිසිය
වාණිජ ඉන්වොයිසිය
ණයවර ලිපිය
ප්‍රභවස්ථාන සහතිකය
රක්ෂණ සහතිකය
සනීපාරක්ෂක සහතිකය

***(ලකුණු 04 යි)***
***(මුළු ලකුණු 10 යි)***

## ***හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:***

***පරිච්ඡේදය 03 - ව්‍යාපාර වලට අදාල උපකාරක සේවා - රක්ෂණය***

(a)

**නීතිමය වගකීම් ආවරණය වීම** - මෙම ආකාරයේ රක්ෂණ ඔප්පු ඕනෑම අනපේක්ෂිත සිදුවීමකින් පැන නගින සියලුම ආකාරයේ නීතිමය වගකීම් ආවරණය කිරීමට උපකාරී වේ. වැඩ කරන අතරතුර යම් අනතුරක් සිදු වුවද එහිදී රක්ෂණය සේවකයාගේ පවුලේ සාමාජිකයින්ට උපකාර වන අතර සමාගමේ වගකීම වන්නේ සේවකයින් ආරක්ෂා කිරීමයි.

**අනතුරු ආවරණය -** කර්මාන්තශාලා සේවක රක්ෂණ යෝජනා ක්‍රමය ඕනෑම හදිසි අනතුරු, තුවාල, මරණ හෝ ආබාධිත තත්ත්වයන්ගෙන් ආරක්ෂාව සපයයි. රක්ෂණ ඔප්පුහිමියා මිය ගියහොත් නම් කරන ලද පවුලේ සාමාජිකයෙකුට වන්දි ලබා ගත හැකි වන අතර වන්දි ගෙවීමේ අවදානම අඩු කිරීමට සමාගම්වලට උපකාර කරයි.

**සේවකයා ආකර්ෂණය කර ගැනීමට හා රඳවා ගැනීමට උපකාරී වීම -** සමාගමට එහි සේවකයින් සඳහා රක්ෂණ ආවරණයක් තිබේ නම් එය දක්ෂ සේවකයින් ව්‍යාපාරයට ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට උපකාරී වේ.

**අවදානම අඩු වීම/වළක්වාගත හැකි වීම -** සේවකයන් රක්ෂණය කර ඇති විට කිසියම් අනතුරක් හේතුවෙන් සේවකයින් මත ආයතනයට දැරීමට ඇති පිරිවැය රක්ෂණ සමාගමට මාරු කළ හැකිය. එබැවින් ආයතනයට කිසිදු මූල්‍ය පාඩුවක් සිදු නොවේ.

**කාර්යසාධනය වැඩි දියුණු වීම -** සේවකයින් සඳහා වන සමහර රක්ෂණ ප්‍රතිපත්ති දරුවන්ගේ අධ්‍යාපනය, සේවක විශ්‍රාම ගැනීම යනාදී මූල්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී උපකාරී වේ. එය සේවක අභිප්‍රේරණය වැඩි කිරීමට පහසුකම් සපයන අතර අවසානයේ එය සේවකයින්ගේ කාර්යසාධනය වැඩි කිරීමට හේතු වේ.

*(ලකුණු 02 යි)*

**(b)** 'රක්ෂණ හිමිකම' යන යෙදුමෙන් අදහස් වන්නේ, රක්ෂණයක් ලබා ගන්නා ඕනෑම පාර්ශ්වයකට රක්ෂණය කරනු ලබන විෂය (පුද්ගලයා, දේපල) පිළිබඳව නීත්‍යානුකූල අයිතියක් තිබිය යුතු බවයි. දේපලක් රක්ෂණය කිරීම සඳහා පහත ලක්ෂණවලින් සමන්විත විය යුතු වේ.

- යම් විෂය වස්තුවක් පැවතීමෙන් මූල්‍යමය වාසියකුත් අහිමිවීමෙන් හෝ හානියක් සිදුවීමෙන් මූල්‍යමය අවාසියකුත් සිදු වීම
- ලබන වාසිය හෝ අවාසිය මුදලින් ගණනය කළ හැකි වීම
- රක්ෂිතයා හා දේපල අතර සම්බන්ධතාවය නීතිමය වශයෙන් ඔප්පු කළ හැකි වීම

මෙහිදී, සීමාසහිත XYZ සමාගම සිය කර්මාන්තශාලා සේවකයින්ගේ අවදානමට එරෙහිව රක්ෂණයක් ලබා ගනී. කර්මාන්තශාලා සේවකයින් සීමාසහිත XYZ සමාගම සමඟ ඇති රැකියා ගිවිසුම යටතේ මෙම අවදානම ආවරණය වන අතර කාර්ය මණ්ඩලය කෙරෙහි ඇති ඕනෑම අවදානමක් ව්‍යාපාරයට සෘජු බලපෑමක් ඇති කළ හැකිය. ඒ අනුව සීමාසහිත XYZ සමාගමට සේවකයන් රක්ෂණය කිරීමේ රක්ෂණ හිමිකමක් ඇත.

*(ලකුණු 04 යි)*

aat SRI LANKA

**(c)**

- අවදානම පුරෝකතනය කළ හැකි වීම
- අනතුරක් පැවතීම/ අවදානම් අහඹු ලෙස සිදු වීම
- අවදානම් සම්බන්ධතාවලින් තොර වීම
- අවදානම් සත්‍යාපනය කළ හැකි වීම

*(ලකුණු 04 යි)*
*(මුළු ලකුණු 10 යි)*

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| *පරිච්ඡේදය 03 - ව්‍යාපාර වලට අදාල උපකාරක සේවා - මුදල් හා බැංකු* |
|---|

**(a)**

- පොදු පිළිගැනීම / සාර්ව ප්‍රතිග්‍රාහීතාවය
- කුඩා ඒකකවලට බෙදීමට හැකි වීම
- රැගෙන යාමට සහ ගබඩා කිරීමට පහසුය
- පහසුවෙන් හඳුනාගතහැකිවීම / සමජාතීය වීම
- පහසුවෙන් අනුකරණය කිරීමට නොහැකි වීම
- වටිනාකමේ ස්ථායිතාවය
- කල් තබා ගත හැකි වීම
- සුලභ හෝ දුලභ නොවීම
- නාමික අගය ද්‍රව්‍යමය අගයට වඩා වැඩි වීම
- නිතර නිතර අවලංගු වීම් වලට භාජනය නොවීම

aat SRI LANKA

*(ලකුණු 03 යි)*

**(b)**
**(i)**

- විද්‍යුත් මුදල් පසුම්බිය
- හර කාඩ්පත්
- ස්මාර්ට් කාඩ්පත්
- මැක්රෝ චිප්ස්
- පෙරගෙවුම් කාඩ්පත්

**(ii)**

- උපයෝගිතා බිල්පත් සඳහා ගෙවීම් කිරීම. විදුලිය, දුරකථන, ලීසිං ආදිය.
- විවිධ බැංකු ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම.
- ගිණුම් ශේෂයන් විමසීම.

- බැංකු ගිණුම් ප්‍රකාශන ලබා ගැනීම.
- ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීම
- චෙක් පොතක් සඳහා ඇණවුම් කිරීම
- සාමාන්‍ය රක්ෂණ මිලදී ගැනීම
- බැංකුවෙන් ණයක් අයදුම් කිරීම
- බැංකු ගිණුම් ප්‍රකාශන මාර්ගගතව (Online) පරීක්ෂා කිරීම

***(ලකුණු 04 යි)***

**(d)**

- බැංකු ශාඛාවේ හඳුනාගැනීමේ අංකය
- චෙක්පතේ දිනය
- බැංකුවේ සහ ශාඛාවේ නම
- මුදල (සංඛ්‍යාවෙන් සහ වචනවලින්)
- අණකරුගේ අත්සන
- චෙක්පතේ අංකය
- ලබන්නාගේ නම/ 'මුදල්' යන යෙදුම
- 'ගෙවනු' යන පදය

***(ලකුණු 03 යි)***

***(මුළු ලකුණු 10 යි)***

***B කොටසෙහි අවසානය***

(මුළු ලකුණු 20 යි)

**C කොටස**

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

*පරිච්ඡේදය 04 - ව්‍යාපාර සංවිධානවල වෙළඳාම*
*පරිච්ඡේදය 02 - ව්‍යාපාර පරිසරය සහ ව්‍යාපාර සංවිධාන කෙරෙහි එහි බලපෑම*
*පරිච්ඡේදය 05 - ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම*
*පරිච්ඡේදය 07 - ව්‍යවසායකත්වයේ දායකත්වය*

**(a)**

- නීතිමය පුද්ගලභාවයක් පැවතීම සහ එනිසා සමාගමේ නමින් නීතිමය කොන්ත්‍රාත්තුවලට ඇතුල් වීමට හැකිවීම.
- ව්‍යාපාරය විසින් ලබන පාඩුවලට එරෙහිව කොටස් හිමියන්ට ඔවුන්ගේ ආයෝජන මට්ටම දක්වා සීමිත වගකීම.
- වඩාත් නීත්‍යානුකූල සහ විධිමත් ක්‍රම හරහා අරමුදල් වැඩිදියුණු කිරීමේ හැකියාව.
- සංස්ථාපිත ව්‍යාපාරයක් වීම තුලින් කොටස්කරුවන්ට වැඩි විශ්වාසයක් පැවතීම.
- අඛණ්ඩ පැවැත්මක් තිබීම.
- මහා පරිමාණව ව්‍යාපාර කටයුතු සිදු කිරීම නිසා මහා පරිමාණ පිරිමැසුම් ලබාගත හැකි වීම.
- කළමනාකරණය හිමිකාරීත්වයෙන් වෙනස් බැවින් දක්ෂ කළමනාකරුවන් බඳවා ගැනීමේ හැකියාව නිසා කළමනාකරණය වඩාත් කාර්යක්ෂම වීම.
- විශාල ප්‍රාග්ධනයක් ආකර්ෂණය කර ගැනීමේ හැකියාව.
- බදු ප්‍රතිලාභ ලබා ගත හැකිවීම.

SRI LANKA

*(ලකුණු 05 යි)*

**(b)**

- දේශපාලන සාධකඃ ව්‍යාපාරය සඳහා රජයේ සහයෝගය, ආනයන සීමා කිරීම
- ආර්ථික සාධකඃ වාහන ආනයනය තහනම් කිරීම, විනිමය අනුපාතය
- සමාජ-සංස්කෘතික සාධකඃ මෝටර්රථ භාවිත කරන්නන්ගේ සමාජ පිළිගැනීම, මිනිසුන්ගේ ජීවන රටාව
- තාක්ෂණික සාධකඃ වාහන ප්‍රතිනිර්මාණය සඳහා භාවිත කරන නවීන තාක්ෂණික ක්‍රම, තාක්ෂණයේ නිතර වෙනස්වීම්
- පාරිසරික සාධකඃ වාහන භාවිතය හේතුවෙන් සිදුවන පරිසර දූෂණය පිළිබඳ උනන්දු වීම්, ද්‍රව්‍ය බැහැර කිරීම්
- නීතිමය සාධකඃ සමාගම් පනත, දේශීය ආදායම් පනත, බදු වෙනස් කිරීමේ බලපෑම

*(ලකුණු 06 යි)*

**(c)**

- සේවක සහභාගීත්වය ලබා ගැනීම සඳහා
- ව්‍යාපාරයේ කීර්තිය වැඩිකරගැනීම සඳහා
- දක්ෂ කාර්ය මණ්ඩලයක් ව්‍යාපාරයට ආකර්ශනය කර ගැනීම සහ රඳවා තබා ගැනීම සඳහා
- විවිධ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා

***(ලකුණු 03 යි)***

**(d)**

- බදු පැනවීම
- උපදෙස් සහ පුහුණුව ලබා දීම
- තොරතුරු සැපයීම
- හුවමාරු පහසුකම් සැපයීම
- මූල්‍ය පහසුකම් සැපයීම
- භාණ්ඩ හා සේවා සඳහා අවම /උපරිම මිල ගණන් පැනවීම
- යටිතල පහසුකම් සැපයීම
- නීති රෙගුලාසි පැනවීම
- මූල්‍ය පාලනයන්

***(ලකුණු 04 යි)***

**(e)**

සෑම ව්‍යාපාරයක්ම අවිනිශ්චිතතා සහ අවදානම්වලට මුහුණ දෙන අතර සමහර අවදානම් සහ අවිනිශ්චිතතා ව්‍යාපාරයේ පැවැත්මට අභියෝගක් විය හැක. නිර්භීත ව්‍යවසායකයෙකු ඒවා දියුණුව සඳහා තවත් අවස්ථාවක් ලෙස සලකනු ලබන අතර ඔහු විසින් ව්‍යාපාරයේ නිර්මාණාත්මක වෙනස්කම් සිදු කරයි. ඕනෑම ව්‍යාපාරයක අවසාන අරමුණ එහි පැවැත්ම වන අතර එම නිසා ව්‍යාපාර එහි පරිසරයට මුහුණ දිය යුතුය. සීමාසහිත සිරි මෝටර් හවුස් (පෞද්ගලික) සමාගම වත්මන් පරිසරය වටහාගෙන එහි පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ආයෝජනය කළ හැකි අවස්ථා තක්සේරු කර ඇත. ව්‍යාපාරය එහි සාමාන්‍ය ව්‍යාපාරික විෂය පථයෙන් ඔබ්බට කල්පනා කර ඇති අතර එහි නව අදහස් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව ඇගයීමට ලක් කර ඇත. බාහිර පරිසරය නිසා ඇති වන අවිනිශ්චිතතාවයෙන් ව්‍යාපාරය ආරක්ෂා කර ගැනීමට මෙය උපකාරී වී තිබේ. එසේම, තත්වය යථා තත්ත්වයට පත් වන තෙක් කෙටිකාලීනව සැලකිය යුතු ආදායමක් උපයා ගැනීමට එය තවත් අවස්ථාවක් ලබා දී ඇත. මෙමගින් ව්‍යාපාරයේ ලාභදායිත්වය ඉහළ නංවා ගැනීමට සහ ප්‍රමාදයකින් තොරව ගෙවිය යුතු මුදල් පියවීමට ද මෙය ඉවහල් වී ඇත.

***(ලකුණු 02 යි)***

***(මුළු ලකුණු 20 යි)***

***C කොටසෙහි අවසානය***

## ***Notice:***

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*